# 2021

# ග්‍රාම සංවර්ධන සැලැස්ම

## 540 B ජයතිලක



ප්‍රාදේශීය ලේකම් කාර්යාලය-දෙහිවල

# 540 B - ජයතිලක

# ග්‍රාම සංවර්ධන සැලැස්ම




ආර්ථික සංවර්ධන නිලධාරි

යූ.එස්.අසංකා මිය

# පටුන


| | පිටු අංක |
|---|---|
| 1) වසම පිළිබඳ හැඳින්වීම | 01 |
| 2) වසමෙහි මාර්ග | 02 |
| 3) වසමෙහි සිතියම | 03 |
| 4) වසමෙහි මූලික තොරතුරු | 03 |
| 5) යටිතල පහසුකම් සංවර්ධන සැලැස්ම | |
| i. මාර්ග පද්ධතිය අලුත්වැඩියාව | 04 |
| ii. කාණු පද්ධතිය අලුත්වැඩියාව | 06 |
| iii. නිවාස පහසුකම් සැලසීම හා සනීපාරක්ෂක පහසුකම් | 07 |
| 6) නිපුණතා සංවර්ධන හා රැකියා වර්ධන සැලැස්ම | 08 |
| 7) සමාජ සංවර්ධනය සඳහා වන සැලැස්ම | 09 |
| i. ගෞරවාන්විත ජ්‍යෙෂ්ඨ පුරවැසි සමාජයක් බිහි කිරීම | 10 |
| ii. නැණබල සහිත ළමා පරපුරක් බිහි කිරීම | 10 |
| iii. මත්ද්‍රව්‍ය උවදුරෙන් තොර සමාජයක් ස්ථාපිත කිරීම | 11 |
| iv. ළමා අපයෝජනය තුරන් කිරීම | 11 |
| v. නීරෝගීකමට මුල් තැන ලබාදීම | 12 |
| vi. සෞඛ්‍ය හා පෝෂණ ගැටලු | 12 |
| 8) ජීවනෝපාය, ව්‍යවසාය සංවර්ධන හා කාන්තා සවිබලකරණ සැලැස්ම | 13 |
| i. ධීවර කර්මාන්තය සවිබල ගැන්වීම | 14 |
| 9) පරිසර කළමනාකරණ සැලැස්ම | 15 |
| 10) කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම | 16 |

## (1) වසම පිළිබඳ හැඳින්වීම

කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වසම් 15 අතුරින් ජයතිලක වසම වර්ගකිලෝමීටර 0.39 ප්‍රමාණයකින් යුක්ත වේ.

උතුරු දෙසින් දෙහිවල නැගෙනහිර, දෙහිවල බටහිර වසම්වලට ද නැගෙනහිර දෙසින් මල්වත්ත වසමටත් බටහිරින් මුහුදු ප්‍රදේශයටත්, දකුණු දෙසින් ගල්කිස්ස/ කරගම්පිටිය ප්‍රදේශයටත් මායිම්ව පිහිටා ඇත.

ජයතිලක  වසමෙහි සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදී විවිධ ජාතීන්ගේ සංකලනයක් දක්නට ලැබේ. ජාතීන් අනුව ජනගහණය ගත් කළ සිංහල 2409 ක් ද දෙමළ 765 ක් ද මුස්ලිම් 1661 බර්ගර් 108 ක් ද මැලේ 54 ක් ද වෙනත් ජාතීන් වර්ග 218 ක් ද වශයෙන් ජීවත් වේ.

ජයතිලක වසම තුළ රාජ්‍ය ආයතන ලෙස දුම්රිය ස්ථානය, තැපැල් කාර්යාලය, ධීවර සංස්ථා කාර්යාලයද රාජ්‍ය බැංකු ලෙස මහජන බැංකුව,ලංකා බැංකුව,ජාතික ඉතිරි කිරීමේ බැංකුවද,රජයේ පාසල් ලෙස  ප්‍රෙස්බිටීරියන් බාලිකා විද්‍යාලය, සුබෝධ බාලිකා විද්‍යාලය හා දෙමළ විද්‍යාලයද පිහිටා ඇත. මීට අමතරව අභයසේල චෛතියාරාම විහාරස්ථානය ද, ක්‍රිස්තියානි රෙපරමාදු සභාව ද, දෙහිවල මොහිදීන් පල්ලිය ද, වසම සතු පොදු ස්ථාන වේ.

ගාලු පාර ප්‍රධාන කොට ඇති මාර්ග පද්ධතියෙහි කාපට්, තාර, කොන්ක්‍රීට්, කැටගල් ඇල්ලූ මෙන් ම සුළු වශයෙන් බොරළු දැමූ පෞද්ගලික මාර්ග ද දක්නට ලැබේ.

අධි නාගරික ප්‍රදේශයක් වන මෙම ප්‍රදේශයෙහි ධනවත් මෙන් ම මධ්‍යම පාංතික ජනතාව ද එසේ ම අඩු ජීවන මට්ටමක් ඇති ජනතාවක් ද වාසය කරති. විවිධ වූ ජීවනෝපාය ක්‍රම යටතේ ඔවුන් තම ජීවිකාව සරිකර ගනිති. රජයේ රැකියාවන්හි නියුතු පිරිස හා ව්‍යාපාරික ප්‍රජාව මෙන් ම තම කායික ශ්‍රමය වැය කරමින් විවිධ වෘත්තින්හි යෙදෙන ජනතාවක් ද ජීවත් වේ. මෙම වසමෙහි එක් මායිමක්ව පිහිටි මුහුදු ප්‍රදේශය වෙරළ බඩ ජනතාවගේ විශේෂ ආදායම් මාර්ගයක් වූ ධීවර කර්මාන්තය සඳහා විශාල දායකත්වයක් සපයයි.

**(2) වසමෙහි මාර්ග**

ෆෙයාලයින් පාර

ග්‍රෙගරි පෙදෙස

රොද්‍රිගු පාර

විජය මාවත

එල්. වී ගුණරත්න මාවත (දුම්රියපොළ පාර)

පී. ටී. ද සිල්වා මාවත

සේනානායක පෙදෙස

ප්‍රනාන්දු පෙදෙස

පාසැල් මාවත

ප්‍රෙස්බිටීරියන් පටුමග

බොතේජු මාවත (ඩී. ඊ. ජයවර්ධන මාවත)

එදිරිවීර මාවත

කල්දේරා පෙදෙස

සුබෝධාරාම පාර

විජේසේකර පාර

ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත (හීල් වීදිය)


හීල් හවුස් උද්‍යානය

මල්වත්ත පාර

ගාලු පාර දකුණ

ගාලු පාර උතුර

**(4) වසමෙහි සිතියම**




**(4) වසමෙහි මූලික තොරතුරු**

| | | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|---|
| පුද්ගල සංඛ්‍යාව | - | 2701 | 2514 |

සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාව - 65

පොරොත්තු ලේඛනයේ සිටින - 12

ප්‍රතිලාභීන් සංඛ්‍යාව

* ආබාධිත දීමනාව 2020 දී ප්‍රතිලාභීන් 07 දෙනෙකුට ලබා දේ.

ප්‍රතිලාභීන්

* මහජනාධාර - 05
* පිළිකා ආධාර - 03
* වැඩිහිටි දීමනාව - 17


## 5) යටිතල පහසුකම් සංවර්ධන සැලැස්ම

අධි නාගරික ප්‍රදේශයක් වන ජයතිලක වසම තුළ යහපත් සනීපාරක්ෂක ජීවන ක්‍රමයක් ස්ථාපිත කිරීම සඳහා වසමෙහි මාර්ග, කාණු, ජලය, විදුලිය, නිවාස, සහ වැසිකිළි පහසුකම් සැලසීම යටිතල පහසුකම් සංවර්ධන සැලැස්මෙහි ප්‍රමුඛ අරමුණක් වේ.

මෙහි මාර්ග ගත් කළ කාපට්, තාර, කොන්ක්‍රීට්, කැට ගල් ආදී වූ වර්ගීකරණයක් පවතින අතර පෞද්ගලික පදිංචිකරුවන් සුළුතරයක් තමන්ගේ අභිමතය පරිදි බොරළු දැමූ මාර්ගවල ජීවත් වේ. වසම පුරා විහිදී යන පරිද්දෙන් කාණු පද්ධතියක් පවතී. වසමෙහි සියලු දෙනාට ජලය පහසුකම් මෙන් ම විදුලිය පහසුකම් ද ඇත. තනි මහල්, දෙමහල්, තෙමහල්, නිවාස මෙන් ම වෙරළ ආශ්‍රිතව තාවකාලික පැල්පත් නිවාස ද දක්නට ලැබේ. එම නිවාස වෙරළ සහ දුම්රිය මාර්ගයට මැදිව පිහිටා ඇති අතර ඒවා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සහ දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල සාදා ඇත. ඒවා අනවසර ලෙස සැලකේ. වසමෙහි සියලු දෙනාට ම පාහේ වැසිකිළි, කැසිකිළි පහසුකම් පවතින අතර අනවසර නිවාස පවතින ප්‍රදේශයට වැසිකිළි පද්ධතියක අවශ්‍යතාවයක් පවතියි.

### I. මාර්ග පද්ධතිය අලුත්වැඩියාව

| | |
|---|---|
| ගැටලුව | ✶ මාර්ග අබලන් වීම නිසා එදිනෙදා කාර්යයන් සඳහා වැය වන කාලය හා ප්‍රමාදය<br>✶ වර්ෂා කාලයේදී ජලයෙන් යට වීම සහ සුළු ගංවතුර තත්වයන් ඇති වීමෙන් නිවාස යටවීම (කොටසක් ප්‍රතිසංස්කරණය කොට කොටසක් ඉතිරි වූ මාර්ග) |
| අරමුණු | ✶ නිසි ප්‍රමිතියෙන් යුත් දීර්ඝකාලීන පැවැත්මක් සහිත මාර්ග පද්ධතියක් සැකසීම.<br>✶ වර්ෂා කාලයේ දී ජලය විධිමත්ව බැස යන ආකාරයට මාර්ග සැකසීම.<br>✶ පදිකයන්ගේ ගමන් පහසුව. |
| උපාය මාර්ග | ✶ ප්‍රා. ලේ. කාර්යාලයේ තාක්ෂණික නිලධාරී/ දෙහි/ ගල් මහනගර සභාවේ ප්‍රධාන නාගරික ඉංජිනේරු, තාක්ෂණ නිලධාරී/ පළාත්බඳ මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්ෂණ නිලධාරි මඟින් අබලන් මාර්ග පරීක්ෂා කර බලා ගැළපෙන ක්‍රමවේදයන් යටතේ දිගු කාලීන පැවැත්මක් තහවුරු වන පරිදි මාර්ග සංවර්ධනය කිරීම. |
| ක්‍රියාකාරකම් | 1) ෆෙයාලයින් පාරෙහි අග කොටස (කාපට් කර ඉතිරි වූ) අංක 43 සිට අංක 53B දක්වා කොටස කාපට් කිරීම. දිග (70 m පමණ) පළල අඩි 08<br>ඍජු ප්‍රතිලාභීන් - 200<br>වක්‍ර ප්‍රතිලාභීන් - 500<br>පවතින තත්වය - තාර දමා ඇත. තැන තැන කැඩී ගොස් ඇත. මෙම මාර්ගය කාපට් කර ඇතත් මෙම කොටස කාපට් කර නොමැති නිසා වැසි කාලයේ දී ජලයෙන් යටවීමක් සිදුවේ.<br>වගකීම - දෙහි/ගල් මහ නගර සභාව. පළාත් බඳ මාර්ග සංවර්ධන අධිකාරිය. |
| ක්‍රියාකාරකම් | 2) ප්‍රනාන්දු ගාර්ඩන්ස්, කොටසක් නිම කර ඇති කාපට් පාර සම්පූර්ණයෙන් නිම කිරීම<br>(අංක 25 සිට 29 දක්වා)<br>දිග - 50 පමන පළල - අඩි 08 පමණ.<br>ඍජු ප්‍රතිලාභීන් - 30<br>වක්‍ර ප්‍රතිලාභීන් - 200<br>දැනට පවිතන තත්වය - තාර දමා ඇත. තැන තැන කැඩී ගොසිනි.<br>වගකීම - දෙහි/ගල් මහනගර සභාව, පළාත්බඳ මාර්ග සංවර්ධන අධිකාරිය |

<table>
<tr>
<td rowspan="2"></td>
<td>3) ග්‍රෙගරි පාර කෙළවර කොටස (සේනානායක පෙදෙසින් හැරෙන කොටස) කාපට් කිරීම.<br>(අංක 15A සිට 43 දක්වා)<br>දිග - 120 පමණ පළල - අඩි 08 පමණ<br>ඍජු ප්‍රතිලාභීන් - 80<br>වක්‍ර ප්‍රතිලාභීන් - 200<br>දැනට පවතින තත්වය - තාර දමා ඇති නමුත් කැඩී ගොස් ඇති අබලන් පාරකි.<br>වගකීම - දෙහි/ගල් මහනගර සභාව, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය</td>
</tr>
<tr>
<td>4) පාසල් මාවත සම්පූර්ණයෙන් කාපට් කිරීම.<br>දුර - 150 m පමණ පළල - අඩි 10 m පමණ<br>ඍජු ප්‍රතිලභීන් - 150<br>වක්‍ර ප්‍රතිලාභීන් - 200<br>දැනට පවතින තත්වය - තාර දමා ඇති මාර්ගයකි. තැනින් තැන කැඩී ගොස් ඇත.<br>වගකීම - දෙහි/ගල් මහනගර සභාව<br>පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය</td>
</tr>
<tr>
<td rowspan="4">ක්‍රියාකාරකම්</td>
<td>5) හිල් හවුස් උද්‍යාන පාර සම්පූර්ණයෙන් කාපට් කිරීම.<br>දිග - 400 m පමණ පළල - අඩි 10 m පමණ<br>(අංක 26 න් ආරම්භ වී අංක 247/1 (රෝහිණී මල් ශාලාව අසල) න් අවසන් වන මාර්ගය)<br>දැනට පවතින තත්වය - තාර දැමූ මාර්ගයකි.<br>ඍජු ප්‍රතිලාභීන් - 150 පමණ වක්‍ර ප්‍රතිලාභීන් - 300 පමණ<br>වගකීම - දෙහි/ගල් මහනගර සභාව, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය</td>
</tr>
<tr>
<td>6) සේනානායක පෙදෙස ආරම්භයේ ඇති පළමු අතුරු මාර්ගයෙහි අවසන් කොටස (කාපට් කර ඉතිරි වී ඇති) අංක 7/6 H න් ආරම්භ වී 7/6 D අවසන් වන කොටස කාපට් කිරීම.<br>දිග - 50 m පමණ පළල - අඩි 08 m පමණ<br>ඍජු ප්‍රති:- 30 වක්‍ර ප්‍රති:- 100<br>වගකීම - දෙහි/ගල් මහනගර සභාව, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය</td>
</tr>
<tr>
<td>7) ධීවර නිවාස ආශ්‍රිත මිදුල කොටස සඳහා කැටගල් ඇල්ලීම (ෆොයාලයින් පාරෙහි අවසානය)<br>(වර්ග අඩි 3000 - 4000)<br>වගකීම - දෙහි/ගල් මහනගර සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</td>
</tr>
<tr>
<td>8) කල්දේරා පාරෙහි අවසානයේ දුම්රිය මාර්ගයට සමාන්තරව පිහිටා ඇති අතුරු මාර්ගය (300 m පමණ) කැට ගල් ඇල්ලීම.<br>වගකීම - දෙහි/ගල් මහනගර සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දුම්රිය දෙපාර්තමේන්තුව<br><br></td>
</tr>
</table>

| | |
|---|---|
| | 9) දුම්රිය පොළ පාරෙහි තැපැල් කාර්යාලය අසලින් ඇති (පෞද්ගලික) අතුරු මාර්ගයෙහි වැසී ඇති කාණුව ප්‍රතිසංස්කරණය කොට මාර්ගය සංවර්ධනය කිරීම (පෞද්ගලික මාර්ගයකි)<br>(අංක 22 ආරම්භ වී 22/6A සහ 26/9 න් අවසන් වේ)<br>දිග - 80 m<br>ප්‍රතිලාභීන් - 30<br>වගකීම - දෙහි/ගල් මහනගර සභාව |
| ක්‍රියාකාරකම් | 10) සේනානායක පෙදෙස සම්පූර්ණයෙන් කාපට් කිරීම.<br>දුම්රියපොළ පාරෙන් ආරම්භ වන අංක 34 සිට ෆෙයාලයින් පාරෙන් අවසාන වන අංක 32 දක්වා කොටස<br>දිග - 200m පළල - අඩි 12 15 පමණ.<br>දැනට පවතින ආකාරය - තාර දමා ඇත.<br>සෘජු ප්‍රතිලාභීන් - 200 වක්‍ර ප්‍රතිලාභීන් - 600<br>වගකීම - දෙහි/ගල් මහනගර සභාව, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය |
| කාලය | මාස 06 |
| වගකීම | ✶ දෙහි/ගල් මහ නගර සභාව<br>✶ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය<br>✶ මාර්ග සංවර්ධන අධිකාරිය<br>✶ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - දෙහිවල<br>✶ දුම්රිය දෙපාර්තමේන්තුව |

## II. කාණු පද්ධතිය අලුත්වැඩියාව

| | |
|---|---|
| ගැටළුව | ✶ වර්ෂා කාලයේ දී කාණු අවහිර වීම නිසා සුළු ගංවතුර තත්වයක් ඇති වීම.<br>✶ පදිකයන්ගේ ගමන් අපහසුව සහ කාණු සඳහා කොන්ක්‍රීට් ආවරණ නොමැති නිසා අනාරක්ෂිත වීම.<br>✶ කාණුවල අපද්‍රව්‍ය පිරී ඇති නිසා කාණුවෙහි ගැඹුර අඩු වීමෙන් සුලු වර්ෂාවක දී පවා මාර්ග යටවීම. |
| අරමුණු | ✶ තිසි ප්‍රමිතියෙන් යුත් දීර්ඝ කාලීන පැවැත්මක් සහිත කාණු පද්ධතියක් සහිත කාණු පද්ධතියක් සැකසීම.<br>✶ පදිකයන්ගේ ගමන් පහසුව සහ කොන්ක්‍රීට් ආවරණ දැමීම මඟින් මාර්ගයට වැඩි ඉඩක් ලබා ගැනීම. |
| උපාය මාර්ග | ප්‍රා. ලේ. කාර්යාලයේ තාක්ෂණ නිලධාරි/ දෙහි/ ගල් මහ නගර සභාවේ ප්‍රධාන නාගරික ඉංජිනේරු, තාක්ෂණ නිලධාරි/ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්ෂණ නිලධාරි මඟින් අබලන් කාණු පරීක්ෂා කර බලා ගැළපෙන ක්‍රම වේදයන් යටතේ දිගු කාලීන පැවැත්මක් තහවුරු වන පරිදි කාණු සංවර්ධනය කිරීම. |
| ක්‍රියාකාරකම් | ✶ සේනානායක පෙදෙසෙහි කාණු සඳහා කොන්ක්‍රීට් ආවරණ යෙදීම.<br>මාර්ගයේ දිග - 200 m කාණුවේ පළල - අඩි 03 පමණ<br>(දුම්රියපොළ පාරෙන් ආරම්භ වන අංක 34 සිට ෆෙයාලයින් පාරෙන් අවසාන වන අංක 32 දක්වා කොටසෙහි කාණුව)<br>සෘජු ප්‍රතිලාභීන් - 200 වක්‍ර ප්‍රතිලාභීන් 600 |
| ක්‍රියාකාරකම් | ✶ ඩී. ඊ. ජයවර්ධන මාවතෙහි වම් පස අංක 02 සිට අංක 12 දක්වා කොටසෙහි කාණුවට කොන්ක්‍රීට් ආවරණ යෙදීම සහ දකුණු පස පාසල් මායිමේ සිට මල්සර උත්සව ශාලාව දෙසට ඇති කාණුවට කොන්ක්‍රීට් ආවරණ යෙදීම. (කාණුවෙහි පළල - අඩි 1 1/2 පමණ) දිග - 70 m පමණ. |
| | ✶ මල්වත්ත පාර නො. 117 කිරි කඩේ අසලින් වම් පස සිට අංක 54A දක්වා කාණු සඳහා කොන්ක්‍රීට් ආවරණ යෙදීම.<br>කාණුවෙහි පළල - අඩි 1 1/2 මාර්ගයෙහි දිග - 200 m පමණ.<br>සෘජු ප්‍රතිලාභීන් - 200<br>වක්‍ර ප්‍රතිලාභීන් 400 |

| | |
|---|---|
| | ✶ වසමෙහි සියලු මාර්ග යටින් දිවෙන භූගත ගලි සියල්ල ම ශුද්ධ පවිත්‍ර කිරීම.<br>(ඒවායෙහි වැලි පිරී ඇති නිසා සියලු කාණු අවහිර වීමෙන් වැස්ස අවස්ථාවලදී කාණු උතුරා ගොස් මාර්ග ද යටවීමක් සිදුවන බැවිණි)<br>✶ වසම පුරා විහිදෙන කාණු පද්ධතිය ශුද්ධ පවිත්‍ර කිරීම. |
| | ✶ ගාලු පාරෙන් හැරී අංක 219 න් ආරම්භ වී අංක 219/2 දක්වා දිවෙන පෞද්ගලික අයිතිය සතු අතුරු මාර්ගයෙහි වැසී ඇති කාණුව ප්‍රතිසංස්කරණය කිරීම.(දිග - 50 m / ප්‍රතිලාභීන් - 30) |
| | ✶ සේනානායක පෙදෙසේ සිට මුහුද දෙසට දිවෙන කාණුවේත්, එදිරිවීර පාර දෙස සිට මුහුද දෙසට දිවෙන කාණුවේත් ගලා ගෙන යන ජලය සමඟ කැළි කසළ ද ගොස් මුහුද ආසන්නයේ දී, එම ජලය මුහුදට එක්වන ස්ථානයේ දී එම කසළ එක් වී අවහිර වීමක් සිදුවන නිසා එම ස්ථානවලට දැලක් දැමීම මඟින් එම අපද්‍රව්‍ය මුහුදට යෑම වැළකෙන අතර සතියකට දෙවතාවක් එම අපද්‍රව්‍ය නගර සභාව මඟින් රැගෙන යාම සිදු කිරීම.<br>වගකීම - නගර සභාව<br>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>දුම්රිය දෙපාර්තමේන්තුව |
| | ✶ සේනානායක පෙදෙසින් එන කාණුවෙහි අවසානයේ(YMCA අසලින්) ෆෙයාලයින් පාර යටින් ඇති ඉපැරණි කාණු ස්වරූපයෙන් පවතින බෝක්කුව සහ ෆෙයාලයින් පාරෙන් විත් ඉනර් ෆෙයාලයින් පාරට හැරුණු පසු එම මාර්ගය යටින් දිවෙන ඉහත කාණුවෙහි කොටසක් වන ඉපැරණි කාණු ස්වරූපයෙන් පවතින බෝක්කුව ද ප්‍රතිසංස්කරණය එය හාරා ගැඹුරු කිරීම සහ නව බෝක්කු දැමීම.<br>(අඩි 03 ක් පමණ පළල කාණුවක්)<br>වගකීම- නගර සභාව |
| කාලය | මාස 06 |
| වගකීම | නගර සභාව |

**III. නිවාස පහසුකම් සැලසීම හා සනීපාරක්ෂක පහසුකම්**

| | |
|---|---|
| ගැටළුව | ✶ අවිධිමත් ඉදිකිරීම් නිසා සමාජීය හා පාරිසරික ගැටළු ඇතිවිට.<br>✶ අඩු පහසුකම් සහිත නීත්‍යානුකූලභාවයක් නොමැති (අනවසර) නිවාස පැවතීම.<br>✶ සුනාමි ව්‍යසනය හමුවේ නිවාස අහිමි වූවන්ට නිවාස නොලැබීම හේතුවෙන් වෙරළාශ්‍රිතව වාසය කිරීමට සිදුවීම. |
| අරමුණ | ✶ නිවාස පහසුකම් සපයාදීම මඟින් ජනයාගේ ජීවන තත්වය නගා සිටුවීම.<br>✶ අනවසර ඉදිකිරීම් අවම කිරීම. |
| උපාය මාර්ග | ✶ නිවාස සංවර්ධන අධිකාරියේ නිළධාරියා මඟින් නිවාස පහසුකම් සලසාදීමට සුදුසු වැඩ පිළිවෙලක් සකසා ගැනීම.<br>✶ අඩු භූමි ප්‍රමාණයකින් වැඩි නිවාස ප්‍රමාණයක් ලබාදීම. |
| ක්‍රියාකාරකම | ✶ වසමේ අඩු පහසුකම් සහිත නිවාස ඇති පුද්ගලයන්ට නිවාස ඉදිකරදීම.<br>✶ අනවසරව ජීවත්වන (වෙරළ ආශ්‍රිතව) ජනතාව සඳහා මහල් නිවාස සංකීර්ණයක් ඉදිකර දීම. (සුනාමි ව්‍යසනයෙන් නිවාස අහිමිවූ ජනතාව සඳහා) |
| වගකීම | නිවාස සංවර්ධන අධිකාරිය. වෙරළ සංරක්ෂණ නිළධාරි.<br>නිවාස සංවර්ධන නිළධාරි. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව.<br>දුම්රිය දෙපාර්තමේන්තුව. |

✶ වෙරළාශ්‍රිතව අනවසරව ජීවත්වන ජනතාව සඳහා වැසිකිළි පහසුකම් අඩු මට්ටමකින් පවතී. ඔවුන් වැසිකිළි පද්ධතියක අවශ්‍යතාව පිළිබඳව දන්වා ඇත. නමුත් ඔවුන් ජීවත් වන්නේ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සහ දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් වූ ඉඩම්වල වේ. සියලුම ජනතාවට සනීපාරක්ෂක පහසුකම එකසේ භුක්ති විඳියය යුතු වුවද අනවසර පදිංචිකරුවන්ට එය ලබාදීම ප්‍රශ්නයක් වන නිසා ජයතිලක වසමට 10Km – 15Km පමණ වූ දුරකින් අංගසම්පූර්ණ වූ මහල් නිවාස ක්‍රමයක් යෝජනා කරමි.

## 6) නිපුණතා සංවර්ධන හා රැකියා වර්ධන සැලැස්ම

තරුණ තරුණියන්ට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අතරමංවීමට සිදුනොවන පරිදි පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය සම්පූර්ණ කරන තෙක්ම පැහැදිලි මාර්ග සැලැස්මක් සකස් කර ඇති අතර ඉන් ඔබ්බට අඩු අධ්‍යාපනයක් ලබන දරුවන් හා පාසල් හැර යන දරුවන් සඳහා තාක්ෂණය භාවිතා කිරීමක් හා වෘත්තීය පුහුණුවක් ලබාදෙමින් නව මාවතකට යොමු කිරීම මෙහි ප්‍රධානතම අරමුණයි. තරුණ තරුණියන්ගේ අනාගතය යහපත් මාර්ගයක් කරා යොමු කරවීමට වසම තුළ සහ ඉන් පිටත පවතින අධ්‍යාපන සහ වෘත්තීය පුහුණු කේන්ද්‍රස්ථාන වෙත යොමු කිරීම කළ යුතු වේ.

| | |
|---|---|
| ගැටළුව | ✶ පාසල් අධ්‍යාපනය මගහැරුණු හා අඩු අධ්‍යාපනය ලබන පිරිස සඳහා වෘත්තීය කුසලතාවය අවම වීම.<br>✶ න්‍යාය හා ප්‍රායෝගික පුහුණුව අවම වීම. |
| අරමුණ | ✶ තරුණ තරුණියන්ගේ වෘත්තීය නිපුණත්වය ඉහළ නැංවීම.<br>✶ පාරම්පරික වෘත්තීන්වල නිරත පිරිස් සඳහා න්‍යායික හා ප්‍රායෝගික දැනුම වර්ධනය කිරීම.<br>✶ තරුණ තරුණියන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම මඟින් නව රැකියා අවස්ථා ලබාදීම. |
| උපාය මාර්ග | ✶ වෘත්තීය පුහුණු නොමැති අය වෘත්තීය පුහුණුවකට යොමු කිරීම.<br>✶ වෘත්තීන්හි නව තාක්ෂණය වර්තමානයට ගැළපෙන ලෙස යවත්කාලීන කිරීම. |
| ක්‍රියාකාරකම් | ✶ පාසල් හැර යන උසස් පෙළ සමත් සිසුන් සඳහා දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇති ජාතික උසස් තාක්ෂණ ආයතනයේ පාඨමාලා සඳහා යොමු කිරීම.<br>උදා:-(උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව, උසස් ජාතික ප්‍රමාණ හා මිනුම් ඩිප්ලෝමා පාඨමාලාව)<br>✶ ධීවර කර්මාන්තය සඳහා අවශ්‍ය නව තාක්ෂණික දැනුම ලබාදීම. (දෙහිවල ධීවර කාර්යාලය සමඟ සම්බන්ධීකරණයෙන්)<br>✶ පල්ලිදොර පාර, කච්චාන පිහිටා ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වෙත යොමු කිරීම.<br>(විවිධ පාඨමාලා සඳහා)<br>පරිගණක පාඨමාලා (Computer Studies Course)<br>තාක්ෂණික පාඨමාලා<br>මාධ්‍ය පාඨමාලා<br>ඉදිකිරීම් පාඨමාලා (Engineering Draughtmanship, Quantity Surveying)<br>කළමණාකරණ පාඨමාලා (Management, Typing shorthand English/Sinhala)<br>✶ රැකියා ගවේෂණ වැඩසටහන්<br>වෘත්තීය අභියෝග ජය ගැනීමේ වැඩසටහන්, වෘත්තීය මාර්ගෝපදේශන විශේෂ වැඩසටහන්, ස්වයංරැකියා ලාභීන් හඳුනා ගැනීමේ හා ලියාපදිංචි කිරීමේ වැඩසටහන්<br>සෘජු රැකියා සඳහා රැකියා අපේක්ෂිතයන්ගේ නම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන්<br>නව යොවුන් විය වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මානව සම්පත් නාලධාරි, කුඩා ව්‍යාපාර නිලධාරි, නිපුණතා සංවර්ධන නිලධාරි හරහා සිදු කිරීම. |
| වගකීම | නිපුණතා සංවර්ධන නිලධාරි, මානව සම්පත් සංවර්ධන නිලධාරි, විද්‍යා හා තාක්ෂණ නිලධාරි, කුඩා ව්‍යාපාර නිලධාරි |

## (7) සමාජ සංවර්ධනය සඳහා වන සැලැස්ම

ග්‍රාමීය සංවර්ධන සැලැස්ම ගොඩනැගීමේ දී විශේෂ වූත් ඉතා වැදගත් වූත් ප්‍රමුඛ සංකල්පයක් වන්නේ සමාජ සංවර්ධනය සඳහා වන සැලැස්මයි. සමස්ත සමාජය ගොඩනැගීමෙන් ගමක්, රටක් ගොඩනැගීම සිදුවන්නේ ඒ නිසාවෙනි. ජව සම්පන්න තාරුණ්‍යයත්, ඵලදායි පුරවැසියෝ හා සතුටින් ජීවත් වන පවුලක්, මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් සමාජයක්, ගෞරවාන්විත ජ්‍යෙෂ්ඨ පුරවැසි සමාජයක්, ආගම දහමට ප්‍රමුඛස්ථානය ලබා දෙමින් ගුණගරුක විනයගරුක සමාජයක්, නැණබල සහිත ළමා පරපුරක් බිහි කරලීම සමාජ සංවර්ධනයේ ප්‍රධාන ඉලක්ක වේ.

ජයතිලක වසමෙහි විවිධ ආගම්, ජාතීන්ගෙන් සමන්විත වූ ජනතාවක් ජීවත් වේ. ඔවුන්ට තම වන්දනාමාන කටයුතු කරගැනීම සඳහා විවිධ ආගම්වලට අනන්‍ය වූ ආගමික ස්ථාන කිහිපයක් වසම තුළ පිහිටා ඇත. බෞද්ධ බැතිමතුන් සඳහා අභයසේල චෛතියාරාම විහාරස්ථානය ද, කතෝලික ජනතාව සඳහා ක්‍රිස්තියානි රෙපරමාදු සභාව ද, මුස්ලිම් බැතිමතුන්ට දෙහිවල මොහිදින් පල්ලිය ද වසම තුළ ඇත. එසේ ම දරුවන්ගේ අධ්‍යාපනය සඳහා ද ප්‍රධාන ජාතික පාසලක් ලෙෂ ප්‍රෙස්බිටීරියන් බාලිකා විද්‍යාලය ද, සෙසු පාසල් වශයෙන් දෙහිවල දෙමළ මහා විද්‍යාලය සහ සුබෝධ බාලිකා විද්‍යාලය පිහිටා ඇත.

මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් සමාජයක් බිහි කිරීම සමාජ සංවර්ධනයේ ප්‍රධාන ඉලක්කයක් වුවද ජයතිලක වසම මත්ද්‍රව්‍ය උවදුරට ගොදුරු වී සිටින වසමක් ලෙස පෙන්වා දිය හැක. මත්ද්‍රව්‍ය භාවිතය ආර්ථික පරිහානිය සමඟ බැඳුණු සමාජ පරිහානියේ ද කැඩපතකි. අද වන විට එය පාසල් දරුවන් අතර පවා පැතිර යන වසංගතයක් බවට පත්වී ඇත. ජයතිලක වසමෙහි එක් මායිමක් මුහුදු ප්‍රදේශයට යාබදව පිහිටා ඇත. වෙරළ බඩ ජීවත් වන ජනතාව ඔවුන්ගේ දුප්පත්කම, නූගත්කම නිසාම මත්ද්‍රව්‍ය සඳහා පෙලඹීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ. නිරෝගී, ජවසම්පන්න තරුණ පරපුරක් බිහිකරලීමට නම් මත් උවදුරෙන් ආරක්ෂා කරගැනීමක් සිදු කළ යුතු වේ. එය ද සමාජ සංවර්ධනය සඳහා වන සැලැස්මෙහි ප්‍රධානතම අරමුණක් වේ.

| | |
|---|---|
| ගැටලුව | ✶ ආගමික ස්ථානයන්හි තිබෙන්නා වූ විවිධ භෞතික, පාරිසරික ගැටළු නිසා ආගමික වතාවත් සිදුකිරීමේදි විවිධ අපහසුතාවයන්ට පත්වීම. |
| අරමුණ | ✶ අපහසුතාවයකින් තොරව වන්දනාමාන කටයුතු සිදුකිරීමට ඉඩ සැලසීම.<br>✶ පහසුකම් සහිත ආගමික සිද්ධස්ථාන බවට පත්කිරීම. |
| උපාය මාර්ග | ✶ ආගමික කටයුතු අමාත්‍යාංශය හරහා මුදල් වෙන්කර ගැනීම.<br>✶ ඒ ඒ ආගමික ස්ථානයන්හි නායක ස්වාමින්වහන්සේ, පූජකතුමා, මවුලවි තම ආගමික ස්ථානයන්හි දායක සභාවන් හා එක්ව ඉදිකිරීම් සැලැස්මක් සකසා ගැනීම. |
| ක්‍රියාකාරකම් | **අභයසේල චෛතියාරාම විහාරය**<br>✶ අභයසේල චෛතියාරාමයේ චෛත්‍ය මළුවට කැටගල් ඇල්ලීම. (පර්චස් 04 පමණ ප්‍රමාණයක)<br>✶ අභයසේල චෛතියාරාමයේ 18 රියන් බුදුපිළිමයක් නෙළීම. (කොන්ක්‍රීට්වලින් සාදා කළුගලින් සේ පෙනෙන පරිදි)<br>✶ පන්සලෙහි එක් මායිමක් වන හිල්හවුස් උද්‍යාන මාර්ගයට යාබද පන්සලෙහි තාප්පය ඉදිකිරීම. (70m දුරකට පමණ)<br>**දෙහිවල මොහිදීන් පල්ලිය**<br>✶ පල්ලියේ තෙවන මහලේ යාඥා කිරීමට වෙනම ඇති ස්ථානයට වහලක් ගැසීම.<br>✶ පල්ලිය මිදුලේ යාඥා කිරීමට වෙනම සෑදූ ස්ථානයෙහි බිම කොන්ක්‍රීට් කිරීම.<br>ප්‍රතිලාභීන් - 1000ක් පමණ<br>**ක්‍රිස්තියානි රෙපරමාදු සභාව**<br>✶ පල්ලියේ පැරිෂ් ශාලාවේ ඇතුළත හා පිටත හුණු සහ තීන්ත ආලේප කිරීම.<br>✶ පල්ලිය හා පැරිෂ් ශාලාවට සූර්ය පැනල ලබා ගැනීම.<br>ප්‍රතිලාභීන් 500 ක් පමණ |
| වගකීම | ✶ බුද්ධ ශාසන හා සංස්කෘතික, ආගමික කටයුතු අමාත්‍යාංශය<br>✶ ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව<br>✶ බෞද්ධ කටයුතු සමායෝජක<br>✶ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව |

**I. ගෞරවාන්විත ජ්‍යෙෂ්ඨ පුරවැසි සමාජයක් බිහි කිරීම.**

| | |
|---|---|
| ගැටලුව | ✶ වැඩිහිටියන් සමාජයේ හුදකලා වීමෙන් පීඩාවට පත්වීම. |
| අරමුණු | ✶ වැඩිහිටි ප්‍රජාව සක්‍රීය සමාජ ක්‍රියාකාරී පිරිසක් බවට පත් කිරීම |
| උපාය මාර්ග | ✶ වැඩිහිටි ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා සමාජ ක්‍රියාකාරකම් සඳහා උපරිම ලෙස දායක කර ගැනීම. |
| ක්‍රියාකාරකම් | ✶ ජයතිලක වසම තුළ ''නව ජීවන'' නමින් වැඩිහිටි සමිතියක් ක්‍රියාත්මක වන අතර එහි සාමාජිකයින් 28 ක් පමණ ඇත. මෙම වැඩිහිටි සමිතිය මඟින් වෛද්‍ය සායන, ඇස් කණ්ණාඩි ලබාදීම මෙන් ම වැඩිහිටි උත්සව ද ක්‍රියාත්මක වේ.<br>✶ වැඩිහිටියන් සුහද හමු, විනෝද චාරිකා සඳහා සහභාගි කරවා ගැනීම.<br>✶ වසමට ආවේණික කර්මාන්තයක් වන ධීවර කර්මාන්තය සඳහා ඒ සඳහා දැනුම ඇති වසමේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ උපදෙස් ලබා ගැනීම.<br>✶ ඔවුන්ගේ පාරම්පරික ශිල්ප ක්‍රම පිළිබඳව තරුණ තරුණියන්ට පුහුණුව ලබා දීම.<br>✶ වැඩිහිටියන් සඳහා නිවසට ම වී සිදු කළ හැකි අත්කම් නිර්මාණ, මැහුම්, ගෙතුම් ආදිය සිදු කිරීමට දිරිගැන්වීම සහ ඒ සඳහා පුහුණුව ලබා දීම. |
| වගකීම | ✶ සමාජ සේවා නිලධාරි<br>✶ සමාජ සේවා දෙපාර්තමේන්තුව |

**II. නැණ බල සහිත ළමා පරපුරක් බිහි කිරීම.**

| | |
|---|---|
| ගැටලුව | ✶ පාසලට දරුවන් ඇතුළත් කිරීමේ දී වසම තුළ පාසල්වල පවතින අඩු පහසුකම් නිසා නගරයෙන් පිට ජාතික පාසලකට ඇතුළත් කිරීමේ ප්‍රවණතාවය වැඩි වීම.<br>✶ පාසල්හි භෞතික සම්පත්වල පවතින සීමිත බව. |
| අරමුණ | ✶ දැනුමින් පිරි පරිපූර්ණ දරුවන් පිරිසක් සමාජගත කිරීම.<br>✶ වසම තුළ ජාතික නොවන පාසල් ආකර්ෂණීය අංගසම්පූර්ණ ජාතික මට්ටමේ පාසල් බවට පත් කිරීම. |
| උපාය මාර්ග | ✶ පාසල් සංවර්ධන සමිතිය කලාප අධ්‍යාපන කාර්යාලය හා එක්ව මුදල් අමාත්‍යාංශයෙන් මුදල් වෙන් කරවා ගැනීමේ සැලැස්මක් සකස් කිරීම.<br>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී රත්මලාන ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ සහය ද ලබා ගැනීම. |
| ක්‍රියාකාරකම් | **සුබෝධ බාලිකා විද්‍යාලය**<br>✶ පාසලෙහි ප්‍රධාන ශාලාවෙහි කඩා වැටී ඇති කොන්ක්‍රීට් කණු අලුත්වැඩියා කිරීම සහ දිරාගිය දොරවල් නැවත අලුත්වැඩියා කිරීම.<br>✶ වැසිකිළි පද්ධතියක් (වැසිකිළි 04 ක්) සහ නාන කාමරයක් ඉදි කිරීම.<br>✶ පාසලෙහි තාප්පය අලුතින් ඉදි කිරීම.<br>✶ පාසල තුළ කාණු පද්ධතිය සකස් කිරීම.<br>✶ පාසල් ගොඩනැගිලි නැවත වයරින් කිරීම.<br>✶ ගෘහ විද්‍යාගාරයේ සිවිලිම සැකසීම. |
| | **ප්‍රෙස්බිටීරියන් බාලිකා විද්‍යාලය (ජාතික පාසලකි)**<br>✶ බුදු මැදුරට ආවරණයක් ඉදි කිරීම.<br>✶ පාසල් මිදුල වැසි ජලයෙන් යට වීම නිසා පාසල අවට භූගත කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම.<br>✶ පාසලේ පිවිසුම සහ මුර කුටිය නිසි ආකාරව ඉදි කිරීම. |
| | **දෙහිවල දෙමළ මහ විද්‍යාලය**<br>✶ පන්ති කාමර හයක් ඉදි කිරීම. [(25' × 40') මහල් තුනකින් යුත්] |

| | |
|---|---|
| | ✶ අලුතින් ඉදි කළ ගොඩනැගිල්ලෙහි වයරින් කටයුතු සිදු කිරීම.<br>✶ අලුතින් ඉදි කළ ගොඩනැගිල්ලෙහි ඇලුමිනියම් ජනේල සහ ඩයමන්ඩ් හැඩැති ග්‍රිල් සවි කිරීම. |
| ප්‍රතිලාභීන් | ශිෂ්‍ය සංඛ්‍යාව<br>සුබෝධ බාලිකා විද්‍යාලය - 90<br>ප්‍රෙස්බිටීරියන් බාලිකා විද්‍යාලය - 2000<br>දෙහිවල දෙමළ මහා විද්‍යාලය - 300 |
| වගකීම | කලාප අධ්‍යාපන කාර්යාලය<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br>පාසල් සංවර්ධන සමිතිය<br>මුදල් අමාත්‍යාංශය |

**III. මත්ද්‍රව්‍ය උවදුරෙන් තොර සමාජයක් ස්ථාපිත කිරීම.**

| | |
|---|---|
| ගැටලුව | තරුණ හා ළමා පරපුර මත්ද්‍රව්‍ය වලට යොමුවීම. |
| අරමුණු | ළමා හා තරුණ පරපුර මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම. |
| උපාය මාර්ග | මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ පුහුණුවලත් ආයතන හා පුද්ගලයන් /මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන හා නිලධාරින් සම්බන්ධ කිරීම. |
| ක්‍රියාකාරකම් | ✶ ජයතිලක වසම තුළ මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ පුද්ගලයින්ව දැනුවත් කිරීමේ වැඩසටහන් වලට යොමු කිරීම.<br>✶ මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් පුනරුත්ථාපන කඳවුරු වෙත යොමු කිරීම සහ ඉන් පසුව වෘත්තීය දැනුමක් සහිතව සමාජගත කිරීම.<br>✶ මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දේශන හා සම්මන්ත්‍රණ වෙත යොමු කිරීම.<br>✶ මත්ද්‍රව්‍ය භාවිතය වැඩි ප්‍රදේශ (වෙරළාශ්‍රිත) තෝරාගෙන ගෙයින් ගෙට ගොස් අත්පත්‍රිකා බෙදාහැරීම.<br>ගොදුරු වී ඇති පිරිස - 200 පමණ<br>✶ වසමේ පාසල් සහ දෙමාපියන් නිරන්තර දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. |
| වගකීම | ✶ අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය<br>✶ ශ්‍රී ලංකා පොලිසිය<br>✶ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව<br>✶ අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය හරහා අන්තරායකර ඖෂධ මත්ද්‍රව්‍ය නිවාරණ පුහුණු කිරීමේ හා මත්ද්‍රව්‍ය ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීමේ නිලධාරි. |

**IV. ළමා අපයෝජනය තුරන් කිරීම.**

| | |
|---|---|
| ගැටලුව | වාර්තාගත නොවූ අපයොජනයට ලක්වන දරුවන් හඳුනා ගැනීම. |
| අරමුණ | ළමා අපයෝජනය හා හිංසනය මැඩලීම. |
| උපාය මාර්ග | ✶ ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය හරහා ප්‍රජා සංවිධාන වල නියෝජනයෙන් අපයෝජනයට හා හිංසනයට ලක්විය හැකි පවුල්වල දරුවන් කලින්ම හඳුනාගැනීමට වැඩපිළිවෙලක් සකස් කිරීම. |
| ක්‍රියාකාරකම් | ✶ අවදානම් සහිත දරුවන් හඳුනාගෙන ඔවුන්ව ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි වෙත යොමුකිරීම සහ ඉන් පසුව පසුවිපරම් කටයුතු සිදුකිරීම.<br>✶ පාසල් දරුවන් හා දෙමාපියන්ට ළමා සුරක්ෂිතතාව පිළිබඳව උපදේශන සහකාර නිලධාරි මගින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.<br>✶ ළමා අපයෝජනය හා හිංසනය පිළිබඳව දැක්වෙන දැන්වීම්, පෝස්ටර් පැසල්වල ප්‍රදර්ශනය කිරීම සහ ඒ පිළිබඳව දරුවන්ට කියවිය හැකි අත්පත්‍රිකා බෙදාහැරීම.<br>✶ පරිවාස භාරයට පත්වන දරුවන් උසාවිය හරහා ජයතිලක වසමේ පිහිටි ගැලවීමේ හමුදා ඉවන්ටයිඩ් නිවාසය හා බාලිකා නිවාසය වෙත යොමු කිරීමත් සිදු කරයි. දැනට දරුවන් 22ක් පමණ ප්‍රමාණයක් නේවාසිකව ඇත. අධ්‍යාත්මික වැඩසටහන් මෙන්ම උපදේශන සේවාද එහි ක්‍රියාත්මක වේ. ඉරිදා උදෑසන පල්ලි යාමද සිදු කරයි. තවද මානසික වර්ධන වැඩසටහන් ද ක්‍රියාත්මක වේ. |
| වගකීම | ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි-ළමා හා පරිවාස දෙපාර්තමේන්තුව<br>උපදේශන සහකාර -සංවර්ධන නිලධාරි-ග්‍රාම නිලධාරි |

## V. නිරෝගීකමට මුල් තැන ලබාදීම.

| | |
|---|---|
| ගැටලුව | බෝ නොවන රෝග සුලබ වීම.<br>අධි නාගරික ප්‍රදේශයක් නිසා ශරීර සුවතා මංතීරු, ළමා උද්‍යාන, ක්‍රීඩාංගන නොමැති වීම. |
| අරමුණ | ✶ වසම තුළ සෞඛ්‍ය සම්පන්න පුරවැසියන් බිහි කිරීම.<br>✶ කායික හා මානසික සමබරතාවයෙන් යුත් පුරවැසියන් බිහි කිරීම. |
| උපාය මාර්ග | ✶ ක්‍රීඩා නිලධාරි, තරුණ සේවා නිලධාරි, හරහා ක්‍රීඩා අමාත්‍යාංශය, තරුණ කටයුතු අමාත්‍යාංශය හා ජාතික තරුණ සේවා සභාව සම්බන්ධීකරණයෙන් වැඩසටහන් සකස් කිරීම. |
| ක්‍රියාකාරකම් | ✶ වසම තුළ ගෙවතු තෝරා ගැනීමේ වැඩසටහන මඟින් වස විසෙන් තොර නීරෝගි ආහාර වේලක් ලබා ගැනීමට ජනකාව උනන්දු කරවීම සහ වගා කටයුතු සඳහා ජනතාව පෙළඹවීම.<br>✶ ළමා විය, පාසල් විය හා වැඩිහිටි විය ආදී ලෙස ජීවිතයේ සියලුම අවධි සඳහා නිවැරදි ආහාර පුරුදු හඳුන්වාදෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>✶ ශාරීරික ව්‍යායාම සඳහාත්, මානසික සුවතාවය සඳහාත් වැඩසටහන් සිදුකිරීම.<br>✶ ජයතිලක වසමෙහි එක් මායිමක් වන වෙරළ තීරයෙහි ළමා උද්‍යානයක් ස්ථාපිත කිරීම මඟින් දරුවන්ගේ කායික, මානසික සමබරතාවය සුරක්ෂිත කිරීම.<br>✶ ධීවර නිවාස ආශ්‍රිත ප්‍රජා ශාලාවේ ඉහළ මහල සාදා එහි පුස්තකාලයක් ස්ථාපිත කිරීම.<br>(ධීවර නිවාස ආශ්‍රිත දරුවන්ගේ මානසික වර්ධනය සඳහා) |
| වගකීම | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, ක්‍රීඩා නිලධාරි, නගර සභාව |

## VI. සෞඛ්‍ය සහ පෝෂණ ගැටලු

| | |
|---|---|
| ගැටලුව | ✶ පාසල් ළමුන්ගේ පෝෂණ ගැටලු.<br>✶ පෙරපාසල් ළමුන්ගේ පෝෂණ මර්දන ගැටලු.<br>✶ ගර්භණී මාතාවන්ගේ පෝෂණ සම්බන්ධ ගැටලු.<br>✶ අඩු බර සහිත ළමුන්ගේ පෝෂණ ගැටලු.<br>(අවු : 05 ට අඩු) |
| අරමුණු | ✶ බල ප්‍රදේශයේ පෝෂණ ගැටලු අවම කිරීම හා නිරෝගීමත් සෞඛ්‍යසම්පන්න පුරවැසියෙක් බිහි කිරීම. |
| උපාය මාර්ග | ✶ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරින් සමඟ වැඩසටහන් සකස් කිරීම. |
| ක්‍රියාකාරකම් | ✶ වසම තුළ පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>✶ වසමෙහි අඩු බර සහිත දරුවන් ත්‍රිපෝෂ ලබා ගැනීමට යොමු කිරීම.<br>✶ ජයතිලක වසමෙහි මාතෘ සායන සඳහා සහභාගි නොවන මවුවරුන් හා ළමයින් ඒ සඳහා යොමුකිරීමට පෙළඹවීම.<br>✶ නිවැරදි හා පෝෂණ ගුණයෙන් යුත් (සමබල) ආහාර රටාවලට දරුවන් හුරු කිරීම.<br>(පෙර පාසල් සහ පාසල් හරහා)<br>✶ පෝෂණ මල්ල ලබා දීමේදී ලබා දෙන ආහාර ද්‍රව්‍ය නැවුම්, ගුණාත්මක භාවයකින් යුක්තව ලබා දීම.<br>(2020 වර්ෂයේදි වසමේ ප්‍රතිලාභින් 18 දෙනෙකුට පෝෂණ මල්ල ලබාදී ඇත.)<br>✶ වසමෙහි පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි මඟින් නිරන්තර උපදේශන සේවා පැවැත්වීම. |
| වගකීම | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි<br>මහජන සෞඛ්‍ය පරීක්ෂක<br>දේශීය වෛද්‍යවරු<br>සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය. |

## (8) ජීවනෝපාය, ව්‍යවසාය සංවර්ධන හා කාන්තා සවිබලකරණ සැලැස්ම.

ජයතිලක වසම තුළ රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික මෙන්ම ස්වයං රැකියා සිදුකරන ජනතාවක් ජීවත් වේ. අධි නාගරිකරණය වූ වසමක් වන මෙහි නගරය ආශ්‍රිතව බොහොමයක් පවතින්නේ වෙළඳසැල් වේ. වසමට මායිම්ව මුහුද පිහිටා ඇති නිසා ඒ ආශ්‍රිත ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වී ඇත්තේ ධීවර කර්මාන්තයයි. ධීවර කර්මාන්තයෙන් යැපෙන පවුල් 160 ක් පමණ ජීවත්වන මෙම වසමෙහි ඉතා පැරණි තොටුපලක්ද පවතී. මෙම තොටුපළෙහි බොහොමයක් පවතින්නෙ එක්දින ධීවර යාත්‍රා වේ. ආහාර පිණිස මත්ස්‍යයන්ද ඉස්සන්, පොකිරිස්සන් මෙන්ම විසිතුරු මසුන් ද මොවුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය වේ. සාමාන්‍යයෙන් වර්ෂයකට මත්ස්‍ය මෙට්‍රික් ටොන් 200ක් පමණ ප්‍රමාණයක් ඇල්ලීම සිදුවේ.

තවද දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් දෙහිවල ග්‍රාමීය ධීවර සංවිධානය, සී/ස දෙහිවල ධීවර කාර්මිකයන්ගේ සමූපකාර සමිතිය සහ සී/ස කොළඹ දිස්ත්‍රික්කයේ සමුදුර කිමිදී විසිතුරු මසුන් අල්ලන්නන්ගේ සමූපකාර සමිතිය මේ සමගාමීව ක්‍රියාත්මක වේ.

ඔමෙන්ම ව්‍යවසාය සංවර්ධනය යටතේ ගත් කල විවිධ වූ ස්වයං රැකියාවන්හි නිරත වුවන්ද දක්නට ලැබේ. ඇඳුම් මැසීම, කුළුබඩු නිෂ්පාදනය, චට්නි වර්ග, කේක් වර්ග නිෂ්පාදකයින් සුළු වශයෙන් ඇත. ඒ සඳහා කුඩා ව්‍යාපාර නිලධාරි මඟින් ඔවුන්ට උපදේශන සේවාව හා ණය පහසුකම් ක්‍රමවේද පිළිබඳ දැනුවත් කිරීමක් සිදු කරයි.

ජයතිලක වසමෙහි පවතින 'සමගි' කාන්තා සමිතිය මඟින්ද කාන්තා සවිබලකරණයට මනා පිටුවහලක් සපයයි. සාමාජිකාවන් 20ක් පමණ එහි සමාජිකත්වය ගෙන ඇති අතර වනිතා සංවර්ධන නිලධාරි හරහා එහි කටයුතු ක්‍රියාත්මක වේ.

| | |
|---|---|
| ගැටලුව | ✶ නිෂ්පාදන සඳහා වෙළඳපොල ධාරිතාව අවම වීම.<br>✶ ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති නිසා සමාජ ආර්ථික ගැටළු වලින් පීඩා විඳීම. |
| අරමුණ | ✶ පුළුල් නිෂ්පාදන වෙළඳපොලක් ඇතිකිරීම.<br>✶ ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීම. |
| උපාය මාර්ග | ✶ විද්‍යාතා හා තාක්ෂණ නිලධාරි සම්බන්ධ කර ගනිමින් පුහුණු අවස්ථා වැඩිකර ගැනීම.<br>✶ කුඩා ව්‍යාපාර නිලධාරි හරහා පුහුණුවීම් වැඩි කිරීම.<br>✶ මැහුම් උපදේශිකාව මඟින් මැහුම් පාඨමාලා ලබාදීම.<br>✶ ආදායම් උත්පාදන මාර්ග කෙරෙහි ප්‍රජා සහභාගිත්වය වැඩි කිරීමට ස්වයං රැකියා සඳහා යොමු කරවීම. |
| ක්‍රියාමාර්ග | ✶ තරඟකාරී නිෂ්පාදන රටාවක් වෙළඳ පොළට හඳුන්වාදෙන ආකාරයට නිෂ්පාදකයින් දිරි ගැනිවීම.<br>✶ සිත්ගන්නා සුළු ඇසුරුම්, දවටන මඟින් ආකර්ෂණීය නිෂ්පාදන ක්‍රියාවලියක් හඳුන්වා දීම.<br>✶ ස්වයං රැකියා ලාභීන් සඳහා අවශ්‍ය උපකරණ, නිෂ්පාදන අමුද්‍රව්‍ය ලබාදීම.<br>✶ කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරි හරහා ණය පහසුකම් ලබාදීමට යොමු කිරීම.<br>✶ සහන පොලියට ණය ලබාදීම.<br>✶ පෞද්ගලික හා රාජ්‍ය අංශයේ රැකියා අවස්ථා ලබාදීම.<br>✶ සමෘද්ධිලාභීන් සඳහා ස්වයංරැකියා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>✶ ජයතිලක වසම තුළ පිහිටි 'සමගි' කාන්තා සමිතිය හරහා කාන්තාවන් ස්වයංරැකියාවන්ට යොමු කිරීම සිදුකරන අතර කාන්තා දිරිගැන්වීමේ වැඩසටහන්, සවිබලගැන්වීමේ වැඩසටහන්, පොදු සුභසාධක වැඩසටහන්, ශ්‍රමදාන කටයුතු සිදු කරයි. |
| වගකීම | කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරි<br>විද්‍යා හා තාක්ෂණ නිලධාරි<br>මැහුම් උපදේශිකා<br>වනිතා සංවර්ධන නිලධාරි |

## I. ධීවර කර්මාන්තය සවිබල ගැන්වීම

| | |
|---|---|
| ගැටලුව | ① <br>✶ මුහුදු ජල මට්ටමට වඩා පහතින් ගල්කිස්ස සිට ගාලු මුවදොර දක්වා ස්වාභාවික කොරල් පරයක් පිහිටා ඇත. <br>✶ ධීවර යාත්‍රා ගොඩබිමට ප්‍රවේශ වීමට මෙය බාධකයකි. <br>✶ දැනට දෙහිවල ජයතිලක වසමෙහි ධීවරයින් තම ධීවර යාත්‍රා ගොඩබිමට රැගෙන එන්නේ මෙම කොරල් පරය පවතින කඩමත්න නැමැති පටු හිඩැස ඔස්සේය. මෙම ස්ථානය අනතුරු සහිත මාරාන්තික ස්ථානයකි. එය එසේ වී ඇත්තේ ගැඹුරු මුහුදේ සිට ගොඩබිමට ඇදී එන රළ පහර මෙම කොරල් පරයේ ගැටී කඩමත්න තුළින් වේගයෙන් නිකුත් වන නිසාවෙනි. <br>✶ දෙහිවල ජයතිලක වසමෙහි ධීවරයින් ද තම ධීවර යාත්‍රා වෙරළට රැගෙන ආ යුත්තේ මෙම වේගවත් ජල පහර ඔස්සේය. සුලු හෝ අතපසුවීමක් සිදු වුවහොත් ධීවර යාත්‍රා කොරල් පරයේ ගැටෙනු ඇත. නොඑසේ නම් ඉහළ රළ පහර හේතුවෙන් බෝට්ටුව පෙරළී යනු ඇත. ජීවිත හානි සිදුවනු ඇත. <br>② ධීවර ආම්පන්නවල පවතින හිඟතාවය. <br>③ අයිස් ගබඩාවක් නොමැති නිසා තැරැව්කරුවන් හරහා පිටත ප්‍රදේශවලින් අයිස් ගෙන ඒමට සිදුවීම. <br>④ ඉන්ධන පිරවුම්හලක් නොමැති නිසා අතරමැදියන් හරහා වැඩි මිලට ඒවා ලබා ගැනීමට සිදුවීම. <br>⑤ ධීවර කර්මාන්තය සවිබල ගැන්වීම <br>✶ කරවල නිෂ්පාදකයින් මාලු මිලදී ගැනීමේ දී වැඩි මිලකට ලබා ගැනීමට සිදු වීම සහ අලෙවි කිරීමේ ගැටලු. |
| අරමුණ | ✶ ජීවිත සුරක්ෂිතතාව ඇති කිරීම. <br>✶ අඟහිඟකම්, අඩු පාඩු අවම වෙමින් ධීවර කර්මාන්තය කරගෙන යාමට හැකි වටපිටාවක් සකස් කිරීම. |
| ක්‍රියාමාර්ග | 1) කොරල් පරයට අවම හානි සිදුවන සේ පරිසර හිතකාමී ලෙස කොරල් පරයේ ඉහළ දාරය ඇලුමිනියම් වැනි කල්පවතින සුදුසු ලෝහයකින් නිර්මාණය කරන ලද චක්‍රාකාර තහඩුවලින් ආවරණය කළ යුතු යැයි ධීවරයින්, කිමිදුම්කරුවන් විසින් යෝජනා කරන ලදී. <br>2) ධීවරයින් සඳහා බෝට්ටු/ බෝට්ටු එන්ජින් යාත්‍රා කඳන් ලබාදීම - (Suzuki horse power 25/40 engine) පිටත සවිකරණ එන්ජින්. <br>3) 4 වෙළුම 2 1/2, 6 වෙළුම 3 1/2 දැල් කට්ටල්. <br>4) (1500 අඩි) දිග/ (250 අඩි) උස දැල් කට්ටල් <br>5) ධීවර ආම්පන්න දැමීම සඳහා කාමර කිහිපයක් ඉදි කිරීම. <br>6) කිමිදුම්කරුවන් සඳහා අවශ්‍ය ඇඳුම් කට්ටල, උපාංග. <br>7) භූමිතෙල් <br>8) ලෙල්ලමට යාබඳව වැසිකිළි කිහිපයක් ඉදි කිරීම. <br>9) අයිස් නිපදවීම සඳහා අයිස් ගබඩාවක් ස්ථාපිත කිරීම. <br>10) ඉන්ධන පිරවුම්හලක් ලබාදීම. <br>11) කරවල නිෂ්පාදකයින් සඳහා අඩු මිලට මාලු ලබා දීමේ වැඩපිළිවෙළක් සැකසීම හා අවශ්‍ය වෙළඳපොළ පහසුකම් සලසා දීම. |
| ප්‍රතිලාභීන් | 160 - 190 |
| වගකීම | වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව <br>වෙරළ සංරක්ෂණ නිලධාරි |

## (9) පරිසර කළමනාකරණ සැලැස්ම

| | |
|---|---|
| ගැටලුව | ✶ අවිධිමත්ව කැළිකසළ බැහැර කරලීම.<br>✶ ජයතිලක වසම තුළ ඉදිකිරීම් නිසා පාරිසරික ගැටලු බහුල වීම.<br>✶ නාගරික ප්‍රදේශයක් නිසා කසළ බැහැර කිරීමට ස්ථානයක් නොමැති වීම.<br>✶ නියමිත පරිදි කසළ ප්‍රවාහනය නොකිරීම.<br>✶ ජයතිලක වසමෙහි ඩෙංගු උවදුර.<br>✶ අනවසර ඉදිකිරීම් නිසා වෙරළ අපවිත්‍ර වීම.<br>✶ වර්ෂා කාලයේදී මාර්ගයන්හි ජල ගැලීම් ඇතිවීම. |
| අරමුණ | ✶ අපද්‍රව්‍ය හා කැළිකසළ මනාලෙස කළමනාකරණය.<br>✶ විධිමත් පරිදි කසළ ප්‍රවාහනයට වැඩ පිළිවෙළක් සැකසීම.<br>✶ ඩෙංගු ව්‍යාප්තිය අවම කිරීම.<br>✶ ස්වාභාවික වෙරළ තීරයේ අනවසර ඉදිකිරීම් ඉවත් කර වෙරළ තීරය පවිත්‍රව තබා ගැනීම. |
| උපාය මාර්ග | ✶ පරිසර හිතකාමී කැළිකසළ බැහැර කිරීමේ උපාය මාර්ග සැකසීම.<br>✶ නගර සභාවේ පවිත්‍රතා අංශය සමග සාකච්ඡා කොට වසමේ ජනතාව සමඟ මනා සම්බන්ධීකරණයෙන් නිසි ලෙස කසළ ප්‍රවාහන ක්‍රමවේදයක් සැකසීම.<br>✶ මහජන සෞඛ්‍ය කාර්යාලය සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඩෙංගු මර්දන ඒකකය සමඟ එක්ව ඩෙංගු මර්දන වැඩපිළිවෙළක් සකස් කිරීම.<br>✶ වෙරළාශ්‍රිත ඉදිකිරීම් පිළිබඳව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ එක්වී ක්‍රියාමාර්ග ගැනීම.<br>✶ ප්‍රමිතියෙන් තොර ඉදිකිරීම් සඳහා නගර සභා අනුමැතිය නොදිය යුතුය. |
| ක්‍රියාමාර්ග | **(කැළි කසළ ප්‍රශ්නය)**<br>✶ කැළිකසළ කළමනාකරණය කිරීම පිළිබඳව පරිසර නිලධාරි හරහා දැනුවත් කිරීම් සිදුකිරීම.<br>✶ කැළිකසළ නිසිලෙස ප්‍රමිතිගත කර බඳුන් ගත කිරීම.<br>✶ නැවත පරිහරණය කළ හැකි අපද්‍රව්‍ය මිලදී ගත හැකි ආයතන හා පුද්ගලයින් සම්බන්ධ කිරීම.<br>✶ තම නිවසේදිම කසළ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි බඳුන්, භාණ්ඩ ලබාදීම.<br>✶ ecobrick නව ක්‍රමවේදයට උචිත ලෙස කසළ බැහැර කිරීම.<br>✶ ප්‍රධාන මාර්ග දෙපස කැළි කසළ දැමීම සඳහා කුඩා බඳුන් සවි කිරීම.<br>✶ වසමෙහි කසළ රැගෙන යන දින සහ ද්‍රව්‍ය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම. |
| | **(ඩෙංගු උවදුර)**<br>✶ ජයතිලක වසම තුළ ප්‍රජා නායකයින් සමග එක් වී වීදි හා මාර්ග සම්බන්ධීකරණයෙන් වීදි කමිටු සක්‍රීය කිරීම.<br>✶ ගෙයින් ගෙට ගොස් ඩෙංගු උවදුර පිළිබඳ දැනුවත් කිරීම, නිවාස පරීක්ෂා කිරීම, අත් පත්‍රිකා බෙදා දීම සිදු කිරීම.<br>✶ වසමෙහි ඩෙංගු රෝගීන් හමුවන ස්ථාන සඳහා ධූමායනය සිදු කිරීම.<br>✶ වසමෙහි පවතින කාණු පද්ධතිය ශුද්ධ කර ක්‍රමවත් ලෙස ඒවා ප්‍රවාහනය. |
| | **(අනවසර ඉදිකිරීම සඳහා)**<br>✶ අනාරක්ෂිත, අවිධිමත්, අනවසර ඉදිකිරීම් සඳහා නගර සභාව අනුමැතිය ලබා නොදිය යුතු වේ.<br>✶ අනවසර ඉදිකිරීම් සඳහා ජලය හා විදුලිය ලබා දීමේ දී ක්‍රමවත් ආකාරයකට සිදු කළ යුතුවේ.<br>✶ වෙරළ තීරයේ ඉදිකර ඇති අනවසර නිවාස පදිංචිකරුවන් සඳහා නව මහල් නිවාස ක්‍රමයක් ආරම්භ කිරීම. |
| වගකීම | පරිසර නිලධාරි<br>ප්‍රජා සංවර්ධන නිලධාරි (නගර සභාව), ප්‍රජා පොලිස් ඒකකය<br>දෙහි/ගල් මහ නගර සභාව<br>සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය<br>මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්<br>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව/ දුම්රිය දෙපාර්තමේන්තුව |

## (10) කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම

ජයතිලක වසම දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය මධ්‍යයේ පිහිටා ඇති නාගරීකරණය වූ ප්‍රදේශයකි. මෙහි භූමිය සම්පූර්ණයෙන් ම පාහේ පිරී ඇත්තේ කොන්ක්‍රීට් වලිනි. නිවාස වලිනි. වගා කිරීමට පවතින්නේ බොහෝ සීමිත ඉඩකඩකි. අපගේ ආර්ථික ප්‍රතිපත්තිය අනුව වෙනත් වෘත්තීන්හි යෙදෙන්නන් පවා ගොවිතැනට ආකර්ෂණය විය යුතු වේ. කුඩා භූමි ප්‍රදේශයක, අඩු නිෂ්පාදන පිරිවැයකින්, උසස් තාක්ෂණික ක්‍රමවේදයක් භාවිතයෙන්, වැඩි ගුණාත්මකභාවයකින් යුත් ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට පෙලඹවීම කෘෂිකාර්මික සංවර්ධන සැලැස්මෙහි ප්‍රධාන අරමුණක් වේ.

| | |
|---|---|
| ගැටලුව | ✶ ගෙවතු වගාව සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් නොමැති වීම.<br>✶ ගෙවතු වගාව පිළිබඳ නාගරික ප්‍රජාවගේ දැනුම අඩු වීම.<br>✶ ගෙවතු වගාව සඳහා සුදුසු බීජ, පැළ වර්ග ලබා දීම. |
| අරමුණ | ✶ නිවාස සංකීර්ණයන්හි සිටින ප්‍රජාව ගෙවතු වගාව සඳහා හුරු කිරීම.<br>✶ නිවසේ පරිභෝජනය සඳහා වගා කරගැනීමට නාගරික ප්‍රජාව පෙලඹවීම.<br>✶ නාගරික ප්‍රජාව අතර ගෙවතු වගාව ප්‍රචලිත කිරීම. |
| උපාය මාර්ග | ✶ අවම ඉඩකඩකින් වැඩි ඵලදායිතාවයක් සහිත වගා ක්‍රමයක් හා බෝග වර්ග හඳුන්වාදීම.<br>✶ වගාව පිළිබඳ දැනුම ඇති නිලධාරින් හා ආයතන (සුදුසු සම්පත්දායකයින්) හරහා සුදුසු සැලැස්මක් සකස් කිරීම. |
| ක්‍රියාකාරකම | ✶ ජයතිලක වසම තුළ පවතින ඉඩකඩ අඩු කම නිසාත් මහල් නිවාස බොහෝමයක් පවතින නිසාත් තිරස් වගා ක්‍රම, බොන්සායි ක්‍රමයට බඳුන්වල වගාව ආදී නව තාක්ෂණික දැනුම, තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම.<br>✶ පටක රෝපණය සහ බද්ධ කිරීමේ ක්‍රමවේද මඟින් ශාක විශාලව වර්ධනය වීම අවම කරගැනීම.<br>✶ ගෙවතු වගා කරුවන් හඳුනාගෙන ගෙවතු වගා සම්බන්ධ රෝග නිවාරණ උපක්‍රම, පොහොර භාවිතය යන වගා නඩත්තු ක්‍රම සම්බන්ධ ශිල්පීය දැනුම ලබා දීම. |
| වගකීම | කෘෂිකර්ම උපදේශක<br>කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර<br>සංවර්ධන නිලධාරි (කෘෂිකර්ම)<br>ආර්ථික සංවර්ධන නිලධාරි<br>ග්‍රාම නිලධාරි<br>සමෘද්ධි සංවර්ධන නිලධාරි<br>ගොවි ජන සේවා නිලධාරි |